**ගාල්ල දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා කාරක සභා 33 - 2024**

---

**1. විගණන මතය**

**1.1** ගාල්ල දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා කාරක සභා 33 හි 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශන, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශන, මුදල් ප්‍රවාහ ප්‍රකාශන සහ ප්‍රමාණාත්මක ගිණුකම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන්වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනතේ 58(1) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මං අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2** ගාල්ල දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා කාරක සභා 33 කට අදාළව නිකුත් කර තිබුණු විගණන වාර්තා කාරක 33 හි ම තත්ත්වාගණනය කළ මතයක් ප්‍රකාශ ක තිබුණු අතර, ඒ සඳහා හේතු වී තිබූ ප්‍රමාණාත්මක දෝෂයන් පහත දැක්වේ.

**1.3 මූල්‍ය ප්‍රකාශන**

**1.3.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත ඇතුළත්ව ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අනුකූල නොවීම**

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගොවිජන බැංකුව ගොවිජන සේවා කාරක සභාවේ උප ඒකකයක් බැවින්, ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතු වුවත්, කාරක සභා 33 විසින් එසේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන (Integrated financial Statement) පිළියෙල කර නොතිබුණි. | එකඟ නොවෙමි. ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්ගේ 7/5/12 ගි.වා පොදු හා 2022.01.11 දිනැති ලිපිය මඟින් ඉදිරිපත් කර ඇති ආකෘතිය අනුව ගොවිජන සේවා කාරක සභා විසින් වාර්ෂික ගිණුම් වාර්තා සකස් කර ඉදිරිපත්කර ඇති අතර ගොවිජන බැංකු නියමු ව්‍යාපෘතිය විසින් ගොවිජන බැංකු කළමණාකරනය, මූල්‍ය පාලනය හා වාර්තාකරණයට අදාළ දෙපාර්තමේන්තු චක්‍රලේක අංක 4/2012(ගො.බැ.) හා 2012.02.29 අනුව වාර්ෂික ගිණුම් වාර්තා සකස් කර ඉදිරිපත් කරනු ලැබේ. | 4/2012 (ගො.බැ.) අංක දරන 2012 පෙබරවාරි 29 දිනැති චක්‍රලේඛ උපදෙස් අනුව 5.6 පොදු (i) අනුව ගොවිජන බැංකුව ගොවිජන සංවර්ධන සභාවේ ඒකකයක් බැවින් ගොවිජන බැංකුවට අදාළ සියළුම ගිණුම් ගොවිජන කාරක සභාවේ වාර්ෂික අවසන් ගිණුම්වලටද ඇතුළත් කොට දැක්විය යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 01හි ඡේද අංක 21 ප්‍රකාරව කාරක සභා 27 ක් මූල්‍ය ප්‍රකාශන වල අන්තර්ගත වියයුතු සංරචකයන් අතුරෙන් ශුද්ධ වත්කම් / හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය පිළියෙල කර මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර නොතිබුණි. | ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්ගේ 7/5/12 ගි.වා පොදු හා 2022.01.11 දිනැති ලිපිය මඟින් ඉදිරිපත් කර ඇති ආකෘතිය අනුව ගොවිජන සේවා කාරක සභා විසින් වාර්ෂික ගිණුම් වාර්තා සකස් කර ඉදිරිපත්කර ඇත. | ශුද්ධ වත්කම් / හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය පිළියෙල කර මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති අංක 01 හි ඡේද අංක 53 ප්‍රකාරව රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති මඟින් සන්සන්දනාත්මක තොරතුරු වෙනස් ලෙස අවශ්‍ය කෙරේ නම් හෝ අවසර දී ඇත්නම් හැර මූල්‍ය ප්‍රකාශනවල වාර්තා කෙරෙන සියලුම සංඛ්‍යාත්මක තොරතුරු සඳහා පසුගිය කාලපරිච්ඡේදයේ සංසන්දනාත්මක තොරතුරු ඉදිරිපත් කළ යුතුය. සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 න් අවසන් වර්ෂයේ ගොවිජන බැංකු 24 ක මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය, මූල්‍ය තත්ත්ව ප්‍රකාශය හා ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශයෙහි පෙර වර්ෂයේ තොරතුරු හෙළිදරව් කර නොතිබුණි. | එකඟ වෙමි.<br>2025 වර්ෂයේදි අවසන් ගිණුම් සැකසීමේදී පෙර වර්ෂයේ අදාළ තොරතුරු ඇතුලත් කිරීමටද ගොවි බැංකු පරීක්ෂාවේදී උපදෙස් ලබා දී ඇත. | මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය, මූල්‍ය තත්ත්ව ප්‍රකාශය හා ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශයෙහි පෙර වර්ෂයේ තොරතුරු හෙළිදරව් කළ යුතුය. |
| (ඈ) | මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන් අනුගමනය කරන බව ගිණුම්කරණ ප්‍රතිපත්ති යටතේ හෙළිදරව්කල යුතු වුවද 2024 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී ගොවිජන සේවා කාරක සභා 06 ක් විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රමිතීන් පිළිබඳ මූල්‍ය ප්‍රකාශන තුළ හෙළිදරව් කර නොතිබුණි. | එකඟ නොවෙමි.<br>වාර්ෂික ගිණුම් වාර්තා අනුව ගිණුම්කරණ ප්‍රතිපත්ති හෙළිදරව් කර ඇත. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන සකස් කල යුතු අතර ඒ බව මූල්‍ය ප්‍රකාශන තුළ හෙළිදරව් කල යුතුය. |
| (ඉ) | ගොවිජන සේවා කාරක සභා 10 ක් විසින් සමාලෝචිත වර්ෂය තුළදී මිලදී ගනු ලැබූ හා ඉවත් කරනු ලැබූ දේපල පිරියත ක්ෂය කරනු ලබන පදනම මූල්‍ය ප්‍රකාශන මඟින් හෙළිදරව් කර නොතිබුණි. | එකඟ නොවෙමි.<br>ලබුදුව ගොවිජන සේවා කාරක සභාව පමණක් ක්ෂය කරනු ලබන පදනම හෙළිදරව් කර නොමැති අතර එය ඉදිරි වර්ෂයේදි නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වා ඇත. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත අනුව දේපළ පිරියත වලට අදාළ ක්ෂය ක්‍රමය හෙළිදරව් කළ යුතුය. |
| (ඊ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 හි 16 ඡේදය අනුව එකිනෙකට වෙනස් ප්‍රතිපත්ති නිශ්චිතව අවශ්‍ය කෙරෙන්නේ නම් හැර සමාන ගනුදෙනු, වෙනත් සිදුවීම් හා තත්ත්වයන් සඳහා අස්ථිත්වයන් විසින් ගිණුම්කරණ ප්‍රතිපත්ති සංගත ලෙස තෝරා ගත යුතුය. නමුත් ගොවිජන සේවා කාරක සභා 03 ක් | එකග වෙමි.<br>මුදල් පදනම මත අක්කර බදු ගිණුම්ගත කර ඇති අතර ඉදිරි වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වා ඇත. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත 03 ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

විසින් රු.630,447 ක් වූ අක්කර බදු ගිණුම්ගත කිරීමේදී මුදල් පදනම භාවිතා කර ඇති අතර අනෙකුත් ගනුදෙනු සියල්ල උපචිත පදනම මත වටිනාකම ගිණුම් තබා තිබුණි.

### 1.3.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2017 වර්ෂයේදී ගොවිජන සංවර්ධන සහකාර කොමසාරිස් කාර්යාලයෙන් ගොවිජන සේවා කාරක සභා 04 කට ලැබී තිබුණු රු. 955,654 ක පරිගණක හා උපකරණ මූල්‍ය ප්‍රකාශනවල දේපල පිරියත උපකරණ ලෙස ගිණුම්ගත කර නොතිබුණි. | පරගොඩ ගොවිජන සේවා කාරක සභාවට 2025 වාර්ෂික ගිණුම් වාර්තා සකස් කිරීමේදි එය නිවැරදි කරන ලෙසට උපදෙස් ලබා දීමට කටයුතු කළ අතර යක්කලමුල්ල,නෙළුව අහංගම යන ගොවිජන සේවා මධ්‍යස්ථානවල පරිගණක හා උපාංග භාවිතයට ගැනීම සම්බන්ධයෙන් අවශ්‍ය උපදෙස් ලබා දිමට කටයුතු කරමි. | ස්ථාවර වත්කම් අත්පත් කර ගන්නා අවස්ථාවේදී එහි පිරිවැය තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතු අතර, අදාළ ගැලපීම් ගිණුම්වල කළ යුතුය. |
| (ආ) | ගොවිජන සේවා කාරක සභා 16 ක් විසින් මධ්‍යස්ථාන පිහිටි ඉඩම් පර්චස් 2014 ක් තක්සේරු කර මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ ජංගම නොවන වත්කම් යටතේ ඇතුලත් නොකිරීම නිසා ජංගම නොවන වත්කම් නිවැරදිව මූල්‍ය ප්‍රකාශන මඟින් පිළිඹිබු නොකෙරුණි. | ගාල්ල දිස්ත්‍රික්කයට අයත් ගොවිජන සේවා මධ්‍යස්ථාන 33 අතුරින් ගොවිජන සේවා මධ්‍යස්ථාන 08ක ඉඩම් තක්සේරු කර ලබා දී ඇති නිසා. 2024 වාර්ෂික ගිණුම් වාර්තාවේ ජංගම නොවන වත්කම් යටතේ හා ස්ථාවර වත්කම් ලේඛණයේ දක්වා ඇත. 2025 වර්ෂයේදි නිවැරදි කිරීමට කටයුතු කරමි. | ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ උපදෙස් පරිදි ඉඩම් නිසි පරිදි වටිනාකම තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතුය. |
| (ඇ) | ඕපාත ගොවිජන සේවා කාරක සභාවේ ගොවි බැංකුව 2024 වර්ෂයට අදාළ කොටස් තැන්පතු පෙර මහ ළමා තැන්පතු හා සමාන්‍ය තැන්පතු වලට අදාළ උපචිත පොලිය ලබා ගැනීමකින් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණි. | එකඟ වෙමි.<br>ඕපාත ගොවිජන සේවා කාරක සභාවේ ගොවි බැංකුව 2024 වර්ෂයට අදාළව කොටස් තැන්පතු ලේඛනය හා සාමාන්‍ය තැන්පත් ලෙජරය යාවත්කාලීන කර ඇත. | ගොවිජන බැංකුවෙහි ලෙජර් ගිණුම් නිසි පරිදි යාවත්කාලීන කිරීමෙන් පසු මූල්‍ය ප්‍රකාශන සකස් කළ යුතු අතර, අදාළ යාවත්කාලීන කිරීම් සිදු කිරීමට පියවර ගත යුතුය.<br>. |
| (ඈ) | ඕපාත ගොවිජන සේවා කාරක සභාවේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශයෙහි භෞතිකව නොපවතින රු.30,000 ක් වූ අන්නාසි වගාව සහ රු.102,865 ක් වූ කුරුඳු වගාවක්ද ජංගම නොවන වත්කම් යටතේ දක්වා තිබුණි. | පිළිතුරු ලබා දී නොමැත. | භෞතිකව නොපවතින වත්කම් ගිණුම් ගත කිරීම නොකළ යුතු අතර, ගිණුම්වල අදාළ ගැලපීම් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | ඕපාත ගොවිජන සේවා කාරක සභාවේ ගොවි බැංකු ලෙජරයේ වූ වටිනාකම රු.60,718 ක් වූ රක්ෂණ ගිණුම මූල්‍ය ප්‍රකාශනවල පෙන්වා නොතිබූ අතර ඌරගස්මංහන්දිය ගොවිජන සේවා කාරක සභාවේ එකතුව රු.8,012,637 ක් වූ ගිණුම් 05 ක් සඳහා ලෙජරයේ ගිණුම් පවත්වා නොතිබුණි. | 2025 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී නිවැරදි කිරීමට ගොවි බැංකු පරීක්ෂාවේදී උපදෙස් දී ඇත. ඌරගස්මංහන්දිය ගොවිජන සේවා කාරක සභාව සම්බන්ධයෙන් පිළිතුරු ලබා දී නොමැත. | ලෙජරයෙහි දැක්වෙන සියළුම ගිණුම් මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට කටයුතු කළ යුතු අතර සියළු අයිතමයන් සඳහා ලෙජර් ගිණුම් පවත්වා ගත යුතුය. |
| (ඊ) | ගෝනගලපුර ගොවිජන සේවා කාරක සභාවේ සමාලෝචිත වර්ෂයේදී වත්කම් අලුත්වැඩියා කිරීමේ අයහාර වියදම රු.121,494 ක් වත්කම් වැඩිදියුණු කිරීමේ වියදමක් ලෙස ගිණුම් ගත කිරිම නිසා වර්ෂයේ ඌණතාවය එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි. | එකඟවෙමි.<br>2025 වර්ෂයේ නිවැරදි කරමි. | අයහාර වියදම් ප්‍රාග්ධනිත නොකළ යුතු අතර, අදාළ ගැලපීම් ගිණුම්වල සිදු කළ යුතුය. |
| (ඒ) | ඌරගස්මංහන්දිය ගොවිජන සේවා කාරක සභාවේ 2024 දෙසැම්බර් 31 දිනට හිඟ අක්කර බදු රු.76,327 ක් වුවද, එය මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ හෙළිදරව් කර නොතිබුණි. | එකඟ වෙමි.<br>2025 වර්ෂයේ නිවැරදි කරන ලෙස උපදෙස් ලබා දීමට කටයුතු කරමි. | හිඟ අක්කර බදු නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතු අතර, අදාළ ගැලපීම් ගිණුම්වල සිදු කළ යුතුය. |
| (ඔ) | කෝදාගොඩ ගොවිජන සේවා කාරක සභාවේ රු.88,890 ක් වූ භෞතිකව නොපවතින තොගයක් අවසන් තොගය තුළ දක්වා තිබුණි. | එකඟ වෙමි.<br>2025 වර්ෂයේ නිවැරදි කරන ලෙස උපදෙස් ලබා දීමට කටයුතු කරමි | විධිමත් අනුමැතියක් ලබාගෙන භෞතිකව නොපවතින තොගය පොත්වලින් ඉවත් කිරීමට කටයුතු කළ යුතු අතර, ගිණුම්වල ගැලපීම් සිදු කළ යුතුය. |
| (ඕ) | පිටිගල ගොවිජන සේවා මධ්‍යස්ථානයේ රු.50,700 ක යල්පැන ගිය තොගය 2024 දෙසැම්බර් 31 දිනට අවසන් තොගයක් ලෙස දක්වා තිබූ නමුත් ඒ සඳහා හානිකරන පරීක්ෂාවක් සිදුකර නොතිබුණි. | එකඟ වෙමි.<br>ප්‍රධාන කාර්යාලයට යොමු කර ඇති අතර අනුමැතිය ලැබීමෙන් පසු ගැලපීම සිදුකිරීමට කටයුතු කරමි. | මෙවැනි තොග සම්බන්ධව හානිකරණ පරීක්ෂාවන් කර ගිණුම්වල අදාළ ගැලපීම් සිදු කළ යුතුය. |

**1.3.3 නොසැසඳූ පාලන ගිණුම් හෝ වාර්තා**

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගොවිජන සේවා කාරක සභා 11 ක මූල්‍ය තත්ත්ව ප්‍රකාශය අනුව | අදාළ ගොවිජන සේවා මධ්‍යස්ථාන විසින් පිළිතුරු විගණනයට යොමු කර | කාරක සභා හා ගොවිජන බැංකු අතර |

| | | |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසන් දිනට ලැබිය යුතු ගොවිජන බැංකු ලාභාංශය හා ගොවිජන බැංකුවේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශය අනුව කාරක සභාවට ගෙවිය යුතු ලාභාංශ ශේෂය අතර රු.1,780,809 ක වෙනසක් නිරීක්ෂණය විය. | ඇත. | ගිණුම් ශේෂ සැසඳීම් සිදු කර නිවැරදි කිරීමට පියවර ගත යුතුය. |

**1.3.4 විගණන සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගොවිජන සේවා කාරක සභා 24 ක එකතුව රු.54,329,131 ක් වූ ගිණුම් විෂයයන් 155 කට අදාළ අවශ්‍ය සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවීම නිසා එම ශේෂ විගණනයේ දී ප්‍රමාණාත්මකව සත්‍යාක්ෂණය කිරීමට හෝ තහවුරු කර ගැනීමට නොහැකි විය. | අදාළ ගොවිජන සේවා මධ්‍යස්ථාන විසින් පිළිතුරු විගණනයට යොමු කර ඇත. | ශේෂයන් සත්‍යායේක්ෂණය කිරීමට අවශ්‍ය ප්‍රමාණවත් හා උචිත සාක්ෂි විගණනයට ඉදිරිපත් කළ යුතුය. |

**1.4 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| | නීති, රීති, රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | **2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනත** 51(1) | | | |
| (i) | වගන්තිය | ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල් විසින් එක් එක් ප්‍රදේශයන්හි ගොවිජන සංවර්ධන සභාවක් සංස්ථාපනය කරනු ලැබීමට ක්‍රියා කළ යුතු වුවත්, ගාල්ල දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා කාරක සභා 33 ක් විසින් මෙතෙක් එම සභාව පිහිටුවීම සඳහා කටයුතු කර නොතිබුණි. | 2000 අංක 46 දරණ ගොවිජන සංවර්ධන පනතේ 51(1) වගන්තිය යටතේ ගොවිජන සංවර්ධන සභාවක් සංස්ථාපනය කලයුතු වුවද එකී පනතේ 99(1) වගන්තිය යටතේ 1979 අංක 58 දරන ගොවිජන සේවා පනත ඉවත් කරන ලද්දේ වුවද 99(2)(ඇ)(1) වගන්තිය ප්‍රකාරව පිහිටුවා තිබුණු ගොවිජන සේවා කාරක සභා 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනතේ ගොවිජන සංවර්ධන සභා පිහිටු | ගොවිජන සංවර්ධන සභා පිහිටුවීමට කටයුතු කළ යුතු අතර, එසේ නොකළ පාර්ශව වෙත පියවර ගත යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | | වන තෙක් ගොවිජන සේවා කාරක සභා තවදුරටත් බලාත්මක බවද දන්වා සිටිමි. | |
| (ii) | 56(1)වගන්තිය | අක්කර බදු අයකිරීම සෑම වර්ෂයකට මාර්තු 31 දිනට අවසන් කල යුතු වුවත් සමාලෝචිත වර්ෂය අවසාන වන විට ගොවිජන සේවා කාරක සභා 07 ක රු.794,947 හිඟ අක්කර බදු ශේෂයක් පැවතුණි. | අක්කර බදු අයවෙමින් පවතින අතර 2025.9.30 දින වන විට අයවිය යුතු ශේෂ පහත ආකාරයෙන් දක්වමි.<br>නියාගම - 182,801.36<br>පිටිගල - 14,615.00<br>ඌරගස්මන්හන්දිය- 60194.70<br>පරගොඩ - 56,708.99<br>තවලම - 240,744.80<br>ඇල්පිටිය - 20,367.60<br>අලුත්වල - 28,072.50 | කාලීනව හිඟ මුදල් අය නොකළ පාර්ශව වෙත පියවර ගැනීමටත්, හිඟ අක්කර බදු අය කිරීම කඩිනම් කිරීමටත් පියවර ගත යුතුය. |
| **(ආ)** | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | | |
| (i) | මුදල් රෙගුලාසි 133 | ගොවිජන සේවා කාරක සභා 22 ක ක්‍රියාකාරිත්වය සම්බන්ධයෙන් අභ්‍යන්තර විගණනයක් සිදු කර නොතිබුණි. | අභ්‍යන්තර විගණනය සිදුකරනු ලබන්නේ ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලය මඟිනි. | වාර්ෂිකව අභ්‍යන්තර විගණනය සිදු කිරීමට කටයුතු කළ යුතුය. |
| (ii) | මුදල් රෙගුලාසි 142(2) | රජය වෙනුවෙන් එකතු කරනු ලබන මුදල් අප්‍රමාදව ප්‍රතිග්‍රාහක නිලධාරියාට යැවිය යුතු වුවත් බටපොල ගොවිජන සේවා කාරක සභාව විසින් ගොවිජන සේවා කොමසාරිස් වෙත ගෙවිය යුතු පොහොර විකුණුම් මුදල් රු.552,916 ක් දිගු කාලයක් තිස්සේ අදාල පාර්ශවය වෙත ගෙවීම් නොකොට රඳවා ගෙන තිබුණි. | පිළිගනිමි.<br>ගෙවිය යුතු මුදලින් කොටසක් ගෙවා ඇති අතර ඉතිරි මුදල් ඉදිරියේදී ගෙවීමට කටයුතු කරන බව වාර්තා කර ඇත. | රජය වෙනුවෙන් එකතු කරනු ලබන මුදල් ප්‍රතිග්‍රාහක නිලධාරියා වෙත යැවීමට කටයුතු කළ යුතු අතර, එසේ නොකළ පාර්ශව වෙත පියවර ගත යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (iii) | මුදල් රෙගුලාසි 143(2)(ඊ) | ගොවිජන සේවා කාරක සභා 10 ක් විසින් හිඟ මුදල් අයකර ගැනිමට විශේෂ පියවර ගෙන නොතිබුණි. | අයවිය යුතු මුදල් කඩිනමින් අයකර ගැනීමට අවශ්‍යා උපදෙස් ලබා දීමට කටයුතු කරමි. | කාලීනව අය කිරීම් සිදු නොකළ පාර්ශව වෙත පියවර ගැනීමටත්, මුදල් රෙගුලාසි ප්‍රකාරව හිඟ මුදල් අයකර ගැනීමටත් කඩිනමින් කටයුතු කළ යුතුය. |
| (iv) | මුදල් රෙගුලාසි 880 සහ 08/2020 දරන 2020 ජුනි 25 දිනැති ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තු චක්‍රලේඛය | මුදල් හෝ ගබඩා භාරව කටයුතු කරන නිලධාරීන් හා ආදායම් එකතු කිරීමේ කටයුතු වලට සම්බන්ධ රාජකාරි ඉටු කරන නිලධාරීන් විසින් ඇප තැන්පත් කළ යුතු වුවත්, ගොවිජන සේවා කාරක සභා 25 ක ප්‍රාදේශීය නිලධාරි සහ ආදායම් එකතු කිරීමේ නිලධාරීන් විසින් ඇප තැන්පත් කර නොතිබුණි. | සියළුම නිලධාරීන් දැනුවත් කර ඇති අතර ඇප මුදල් තැන්පත් කිරීමේ කටයුතු කඩිනමින් සිදුකරමි. | ප්‍රාදේශීය නිලධාරී සහ ආදායම් එකතු කිරීමේ නිලධාරීන්ගෙන් ඇප තැන්පත් ලබා ගත යුතු අතර, එසේ නොකළ පාර්ශව වෙත පියවර ගත යුතුය. |
| **(ඇ)** | **ගොවිජන සේවා කොමසාරිස්ගේ චක්‍රලේඛ** | | | |
| (i) | 1986 ඔක්තෝබර් 21 දිනැති අංක 264 දරන චක්‍රලේඛය | කම්වු ගොඩනැගිල්ලේ කාමර කුලියට දී ඇති විවිධ දෙපාර්තමේන්තු හෝ ආයතන වෙතින් වර්ෂය ඇතුලත ලැබිය යුතු කාමර කුලී වර්ෂය අවසන් වීමට හය මාසයකට පෙර එම වර්ෂයේ දෙසැම්බර් දක්වා වවුචර් පිළියෙල කර ඉදිරිපත් කර, එම කුලී මුදල් අයකරගත යුතු වුවත්, එලෙස කටයුතු නොකිරීම නිසා රු.1,118,456 ක කාමර කුලී අය නොවූ කාරක සභා 09 ක් පැවතුණු අතර ඉන් පරගොඩ ගොවිජන සේවා කාරක සභාවේ කාමර කුලී වසර 30 ක කාලසීමාවක් තිස්සේ අය නොවී පැවතුණි. | අයවිය යුතු මුදල් කඩිනමින් අයකර ගැනීමට අවශ්‍යා උපදෙස් ලබා දීමට කටයුතු කරමි | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කර අයවිය යුතු මුදල් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතු අතර, එසේ කර නොමැති පාර්ශව වෙත විධිමත් පරිදි පියවර ගත යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ii) | 1988 මැයි 27 දිනැති අංක 322(7/10/4/3) දරන චක්‍රලේඛය | ඉඩම් ප්‍රවේණි බදු මුදල් භාරගත් දින සිට දින 14 ක් ඇතුළත අදාළ පුද්ගලයින්ට ගෙවීමට කටයුතු කළ යුතු අතර අවුරුද්දක කාලයක් තුළ මුදල් භාර නොගන්නේ නම් ගොවිජන සේවා අරමුදලට බැර කල යුතුය. ඊට අනුකූලව කටයුතු නොකිරීම හේතුවෙන් ගොවිජන සේවා කාරක සභා 02 ක සමාලෝචිත වර්ෂය අවසානයට නිරවුල් නොකල රු.122,604 ක ප්‍රවේණි බදු මුදල් ශේෂයක් පැවතුණි. | යක්කලමුල්ල - අයවිය යුතු හා ගෙවිය යුතු ශේෂ නිරවුල් කිරීම යටතේ අනුමැතිය සඳහා යොමු කර ඇත. | නිරවුල් නොකළ ප්‍රවේණි බදු මුදල් ශේෂයන් අප්‍රමාදව නිරවුල් කිරීමට කටයුතු කළ යුතු අතර, එසේ නොකළ පාර්ශව වෙත පියවර ගත යුතුය. |

**02. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

සමාලෝචිත වර්ෂයේ කාරක සභා 30 ක මෙහෙයුම් ප්‍රතිඵල එකතුව රු. 12,132,885 ක අතිරික්තයක්ද, කාරක සභා 03 ක රු. 474,996 ක ඌනතාවයක්ද වූ අතර, ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ කාරක සභා 21 ක මෙහෙයුම් ප්‍රතිඵල එකතුව රු. 3,959,154 ක අතිරික්තයක්ද, කාරක සභා 12 ක රු. 1,131,090 ක ඌනතාවයක්ද විය. ඒ අනුව කාරක සභා 33 හි සමස්ථ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.8,829,825 ක වර්ධනයක් නිරීක්ෂණය විය.

**03. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ලබුදූව ගොවිජන සේවා කාරක සභාවට 2022 හා 2024 වසර තුළ ලද ගොවි පැමිණිලි 99 කින් පැමිණිලි 37 කට විසඳුම් ලබාදී නොතිබුණි. එනම් මුළු පැමිණිලි ප්‍රමාණයෙන් සියයට 37 ක් විය. | මධ්‍යස්ථානය වෙත ලද පැමිණිලි 99 න් නියෝජ්‍ය කොමසාරිස්ට යොමු කර ඇති පැමිණිලි 24 හැරුණු කොට ඉතිරි ඒවා සඳහා විසඳුම් ලබාදී ඇත. | ගොවි පැමිණිලි කඩිනමින් නිරවුල් කිරීමට කටයුතු කළ යුතු අතර, ඒ සඳහා විධිමත් වැඩපිළිවෙලක් සැකසිය යුතුය. |
| (ආ) | ගොවිජන සේවා කාරක සභා 03 ක බැංකු ගිණුම්වල රු.3,660,006 ක මුදලක් 2024 දෙසැම්බර් 31 දිනට පැවති නමුත් ඵලදායී ආර්ථික කටයුත්තක ආයෝජනය කර නොතිබුණි. | අතිරික්ත මුදල් ස්ථාවර තැන්පතුවල යෙදවීමට කටයුතු කරමි. | විධිමත් අනුමැතිය යටතේ ගොවිජන සේවා කාරක සභාව සතු මුදල් ඵලදායීව යෙදවීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 09/2009 ප්‍රකාරව සියළුම රාජ්‍ය ආයතනවල ඇඟිලි සලකුණු සටහන් කිරීමේ යන්ත්‍ර භාවිතය මඟින් නිලධාරීන් කාර්යාලයට පැමිණීම හා පිටවීම සනාථ කිරීම් සම්බන්ධයෙන් වූ වාර්තා තබා ගත යුතු වුවද ගොවිජන සේවා කාරක සභා 10 ක ඇඟිලි සලකුණු යන්ත්‍රය ක්‍රියාවිරහිත තත්ත්වයේ පැවතුණි. | නියාගම, යක්කලමුල්ල, නෙළුව, ගෝණදෙනිය, ඌරල, අම්බලන්ගොඩ යන මධ්‍යස්ථාන සඳහා ඇඟිලි සලකුණු යන්ත්‍ර මිලදි ගැනීම සඳහා ප්‍රසම්පාදන කටයුතු සිදුකර මිලදී ගැනීමේ කටයුතු සිදුකරමින් පවති.<br>පරගොඩ - ප්‍රසම්පාදනය කර අනුමැතිය සඳහා ප්‍රධාන කාර්යාලයට යොමු කර ඇත.<br>කොග්ගල - මිලදී ගෙන ක්‍රියාත්මක තත්වයේ පවතී. | චක්‍රලේඛ ප්‍රකාරව ඇඟිලි සලකුණු යන්ත්‍ර මඟින් නිලධාරීන්ගේ පැමිණීමේ හා පිටවීමේ වාර්තා පවත්වා ගෙන යාමට කටයුතු කළ යුතු අතර, ඊට අනුකූල නොවූ පාර්ශව සම්බන්ධයෙන් පියවර ගත යුතුය. |
| (ඈ) | පිටිගල ගොවිජන සේවා මධ්‍යස්ථානයේ පැවති ට්‍රැක්ටරය 2020 සැප්තැම්බර් 11 දින ගොවිජන සංවර්ධන කොමසාරිස් හරහා බටගන්විල විශ්ව විද්‍යාල ආයතනයට භාරදී තිබූ අතර ඌරගස්මංහන්දිය ගොවිජන සේවා කාරක සභාවේ වූ ශිව්බරා ට්‍රැක්ටරය 1988 දිනදි පවරා ගෙන අලෙවි කර තිබුණි. එමෙන්ම කෙරදේවල ගොවිජන සේවා කාරක සභාව සතුව තිබූ කුබෝටා වේලරය හා තල දෙක තැටි නගුල යන උපකරණ 2017 වර්ෂයේදී අලෙවි කර තිබුණි. නමුත් මෙම වත්කම්වලට අදාළ රු.576,408 ක් වූ වගකීම් සමාලෝචිත වර්ෂයේදීද නිරවුල් කර නොතිබුණි. | එකඟ වෙමි.<br>2025 වර්ෂයේ නිවැරදි කරන ලෙස උපදෙස් ලබා දීමට කටයුතු කරමි. | වත්කම් ඉවත් කිරීමේදී ඒ හා බැඳුණු වගකීම් නිරවුල් කිරීමට විධිමත් පියවර ගත යුතුය. |
| (ඉ) | කරන්දෙණිය ගොවිජන සේවා කාරක සභාව සතුව රු.115,276 ක ණය මුදලකට මිලදී ගෙන තිබූ ට්‍රැක්ටරය 1989 දී පුළුස්සා තිබූ අතර 1990 ජනවාරි 11 දින ලබුදූව නියෝජ්‍ය කොමසාරිස් කාර්යාලයට රැගෙන ගොස් තිබුණද මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම නොවන වගකීම් යටතේ දක්වා තිබෙන ණය මුදලේ ශේෂය සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂය දක්වාම කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | එකඟ වෙමි.<br>අයවිය යුතු හා ගෙවිය යුතු ශේෂ නිරවුල් කිරීම යටතේ 2025.06.09 දින ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල් වෙත යොමු කර ඇති අතර අනුමැතිය ලද පසු ගැලපීම සිදු කරමි. | - එම - |

## 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගොවිජන සේවා කාරක සභා 10 කට අදාළව හඳුනා ගත් වගා නොකර ලද කුඹුරු ඉඩම් අක්කර 2750 ක් පමණ සමාලෝචිත වර්ෂයේදී වගා කටයුතු සඳහා යොදවා ගෙන නොතිබුණි. | එකමිටට ගොවිබිමට වැඩසටහන යටතේ මේ වන විට වගා කිරීමට අවශ්‍ය ගොවීන් දැනුවත් කිරීමේ කටයුතු සිදුකරමින් පවතී. | වගා කල හැකි සියළු කුඹුරු ඉඩම් හා ගොඩ ඉඩම් වගා කිරීමට විධිමත් වැඩපිළිවෙලක් යෙදිය යුතුය. |
| (ආ) | ගොවිජන සේවා කාරක සභා 09 කට අදාළව වී වගාව සඳහා යෙදවිය හැකි A ශ්‍රේණියේ පුරන් කුඹුරු ප්‍රමාණය අක්කර 2081 රූඩ් 01 ක් හා වී වගාව හැර වෙනත් කෙටි කාලීන භෝග වගාවන් සඳහා යෙදවිය හැකි B ශ්‍රේණියේ පුරන් කුඹුරු අක්කර 774 ක් වී වගාව හෝ වෙනත් වගාවන් සඳහා යෙදවීමට කටයුතු කර නොතිබුණි. | • වී වගාවට යෙදවිය හැකි කුඹුරුවල කරදිය මිශ්‍රවීම හේතුවෙන් වගා කිරීමට නොහැකි වී ඇත.<br>• මාදුගඟ ආශ්‍රිත වසම්වල කුඹුරු වර්ෂයක් වර්ෂයක් පාසා ඇතිවන ලවණ ගතිය වැඩි වීම ද කුඹුරු ඉඩම් වගා කිරීමට නොහැකි වීමට හේතුවක් වී ඇත.<br>• B ශ්‍රේණියේ පුරන් කුඹුරුවලින් කොටසක් කෙටි කාලීන බෝග වගා කිරීමට තරම්වත් නොහැකි හැල් තත්වයේ පවතී | විධිමත් පරිදි කටයුතු කර වී වගාව සඳහා යොදා ගත හැකි කුඹුරු වී වගාව සඳහාද අනෙක් ඉඩම් වෙනත් කෘෂිකාර්මික කටයුතු සඳහා යොදවා ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3.3 මූල්‍ය අක්‍රමිකතා

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ලබුදූව ගොවිජන සේවා කාරක සභාවේ ජංගම ගිණුමේ පැවති රු.106,780 ක් වූ ශේෂය 1999 වර්ෂයේදි චෙක්පතක් ලියා ශුන්‍ය කර ඇති බවට බැංකු වාර්තා මගින් වාර්තා කර තිබුණද මේ සම්බන්ධයෙන් වෙනසට හේතු සොයා බැලීමකින් තොරව මූල්‍ය ප්‍රකාශනයේ රු.382,066 ක ශේෂයක් ජංගම වත්කම් යටතේ දක්වා තිබුණි. මේ පිළිබඳව පරීකෂා කිරීම සඳහා විධිමත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | අදහස් දක්වා නොමැත. | මෙම තත්ත්වය සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් පවත්වා අදාළ පරිදි කටයුතු කළ යුතුය. |
| (ආ) | ගොවිජන සේවා කාරක සභා 03 කට අදාළව රු.99,844 ක මුදල් අඩුව හා | විශ්‍රාම ගැනීමේදී අදාළ මුදල් පාරිතෝෂිතයෙන් අඩුකර | රජයට අයවිය යුතු මුදල් අයකර ගැනීමට කටයුතු කළ |

| | | | |
|---|---|---|---|
| | වැඩිපුර ගෙවීම් සම්බන්ධව පරීක්ෂණ පවත්වා ඊට වගකිව යුතු පාර්ශවයන්ගෙන් අලාභ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ගැනීමටත් අනෙක් ශේෂ නිරවුල් කිරීම සඳහා ගොවිජන සංවර්ධන නියෝජ්‍ය කොමසාරිස් වෙත උපදෙස් සඳහා යොමු කර ඇත. | යුතුය. |
| (ඇ) | ගොවිජන සේවා කාරක සභා 04 කට අදාළව රු.111,331 ක් වූ තොග ඌණතාවයන් සම්බන්ධයෙන් පරීක්ෂණ පවත්වා ඊට වගකිව යුතු පාර්ශවයන්ගෙන් එම අලාභය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | පිලාන ගොවිජන කාරක සභාවේ තොරුතුරු නොමැති බැවින් අයවිය යුතු හා ගෙවිය යුතු ශේෂ නිරවුල් කිරීම යටතේ අනුමැතිය සඳහා යොමු කර ඇත. පිටිගල ගොවිජන සභාවේ මෙම මුදල් අයවෙමින් පවතින බව වාර්තා කර ඇත. සොරුන් විසින් රැගෙන යන ලද ඌරගස්මන්හන්දිය ගොවිජන සේවා කාරක සභාවේ පොහොර සම්බන්ධයෙන් පරීක්ෂණයක් සිදුකරමින් පවතී. | වගකිව යුතු පාර්ශවයන්ගෙන් අලාභ අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | ගෝනදෙණිය හා පිංකන්ද ගොවිජන සේවා කාරක සභාවල අලෙවි සැල් බදු ගිවිසුමකින් තොරව පිළිවෙලින් රු.47,000 ක වාර්ෂික බදු කුලියට හා මාසිකව රු.8,500 කට බදු පදනමින් ලබාදී තිබුණි. | 2025 වර්ෂයේදී ගිවිසුම්ගතව පවත්වා ගෙන යනු ලැබේ. | රජය සතු වත්කම් නිසි පරිදි ගිවිසුම් ගත වීමකින් පසු බදු දීමට කටයුතු කළ යුතු අතර, එසේ නොකළ පාර්ශව වෙත පියවර ගත යුතුය. |

### 3.4 කුවිතාන්සි පොත් නැතිවීම

| | **විගණන නිරීක්ෂණ** | **කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ) | නෙළුව ගොවිජන සේවා කාරක සභාවේ තඹලගම කොට්ඨාශයේ කෘ.ප.නි.ස. නිලධාරීට 2019 වර්ෂයේදී නිකුත් කල කුවිතාන්සි පොතක් නැවත භාර නොදීම සම්බන්ධව විමර්ශන කටයුතු 2025 විගණිත දින දක්වාම අවසන් කර නොතිබූ අතර 2023 ජුනි 07 දින හා 2023 නොවැම්බර් 02 දින කෙරදේවල ගොවිජන සේවා මධ්‍යස්ථානයේ නිකුත් කර තිබූ කුවිතාන්සි පොත් 02 ක් නැවත කාර්යාලයට භාරදීම පිළිබඳව ලිඛිත සටහන් නොතිබුණි. | මු.රෙ.104 පරීක්ෂණය පවත්වා අවසන් වාර්තාව ප්‍රධාන කාර්යාලයට අනුමැතිය සඳහා යොමු කර ඇත. උපදෙස් අනුව ඉදිරියේදි කටයුතු කරමි. | කුවිතාන්සි පොත් හා උප පත්‍රිකා පොත් නිසි පරිදි නිකුත් කිරීම හා භාර ගැනීම සිදු කළ යුතු අතර එසේ නොවන අවස්ථාවලදී ඊට අවශ්‍ය ක්‍රියාමාර්ග කඩිනමින් ගැනීමට කටයුතු කළ යුතුය. |

**3.5 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට පටහැනි ගනුදෙනු**

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | නියාගම හා තවලම ගොවිජන සේවා කාරක සභාවල එකතුව රු.1,140,200 ක බිත්තර වී සහ පොහොර මිලදී ගැනීමේදී 2006 වර්ෂයේ නිකුත් කළ රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2006.1.2.1 හි දක්වා ඇති අරමුණු ඉටු වන ආකාරයට කටයුතු සිදුකර නොතිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන් අනුගමනය කරමින් අදාළ මිලදී ගැනීම් කිරිමට ඉදිරියේදී උපදෙස් දීමට කටයුතු කරමි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්ට අනුකූලව කටයුතු කළ යුතු අතර, එසේ නොකළ පාර්ශව වෙත පියවර ගත යුතුය. |

**3.6 නිෂ්කාර්ය වත්කම්**

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | භාවිතයට නොගන්නා ට්‍රේලරයක්, රෝද 04 ටැක්ටර් මැෂිමක්ද වර්ෂ 15 ක් තිස්සේ අහංගම ගොවිජන සේවා කාරක සභාවේ කාර්යාල භූමියේ නිෂ්කාර්යව පැවතුණි. | ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙන් අපහරණය සඳහා පරීක්ෂණ කමිටුවක් විසින් පරීක්ෂා කර ලද අතර වාර්තාව ලැබුණු පසු ඉදිරි කටයුතු සිදුකරමි. | භාවිතයට ගත නොහැකි වත්කම් විධිමත් පරිදි කටයුතු කර කඩිනමින් අපහරණය කිරීමට කටයුතු කළ යුතුය. |

**3.7 වෙනත් වැදගත් විගණන නිරීක්ෂණ**

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගොවිජන සේවා කාරක සභා 22 ක දීර්ඝ කාලයක සිට මූල්‍ය ප්‍රකාශනවල ඉදිරියට ගෙන එනු ලබන රු.5,875,034 ක් වූ අය විය යුතු ශේෂ 111 ක් හා ගොවිජන සේවා කාරක සභා 23 ක රු.12,227,099 ක් වූ ගෙවිය යුතු ගිණුම් ශේෂ 152 ක් සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අයවිය යුතු හා ගෙවිය යුතු ශේෂ නිරවුල් කිරිම යටතේ ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල් වෙත අනුමැතිය සඳහා අයවිය යුතු ශේෂ 86ක් හා ගෙවිය යුතු ශේෂ 93ක් ප්‍රධාන කාර්යාලය වෙත යොමු කර ඇත. අනුමැතිය ලැබීමෙන් පසු ඉදිරි කටයුතු සිදු කරමි. | කාලීනව අය කිරීම් සිදු නොකළ පාර්ශව වෙත පියවර ගැනීමටත්, අය විය යුතු ශේෂ අයකර ගැනීමටත් ගෙවිය යුතු ශේෂ නිරවුල් කිරීමටත් අවශ්‍ය ක්‍රියාමාර්ග කඩිනමින් ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ගොවිජන සේවා කාරක සභා 18 කට අයත් ගොවිජන බැංකු 18 ක් විසින් ගොවීන් වෙත නිකුත් කර තිබූ ව්‍යාපෘති ණය, කෘෂි ණය හා ලක්ෂයේ ණය වලින් ගොවීන් 1180 ක ගෙන් අය විය යුතු එකතුව රු.23,187,555 ක ණය ශේෂ කල්පසු වී තිබුණි. එම ණය අයකර ගැනීමේ ප්‍රගතිය මන්දගාමී මට්ටමක පැවතුණි. | පිලිගනිමි. මේ වන විට උක්ත කල් පසුවූ ණය අයකර ගැනීම සඳහා විනිශ්චය සභා සහ අධිකරණ ක්‍රියාමාර්ග වෙත යොමු වී ඇත. | කාලීන හිඟ ණය අය නොකළ පාර්ශව වෙත පියවර ගැනීමටත්, 2012 පෙබරවාරි 29 දිනැති 4/2012 දරන ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තු චක්‍රලේඛය ප්‍රකාරව වාරික හා පොලී මුදල් අයකර ගැනීමටත් කටයුතු කළ යුතුය. |
| (ඇ) | ගොවිජන සේවා කාරක සභා 11 ක අදාළ බල ප්‍රදේශය තුළ ලියාපදිංචි ගොවි සංවිධාන 78 ක් විසින් අදාළ ගොවිජන බැංකුව තුළ ඉතුරුම් ගිණුම් පවත්වාගෙන ගොස් නොතිබුණි. | ගොවි බැංකු ගිණුම් පවත්වාගෙන නොගිය ලියාපදිංචි ගොවි සංවිධාන ලිඛිතව දැනුවත් කර තැන්පත් ලබා ගැනීමට කටයුතු කරන ලෙස මධ්‍යස්ථාන පරීක්ෂාවේදි උපදෙස් දී ඇත. | 09/2020 අංක දරන 2020 ඔක්තෝබර් 08 දිනැති චක්‍රලේඛ ප්‍රකාරව ගොවිජන බැංකුව තුළ ඉතුරුම් ගිණුම් පවත්වා ගෙන යාමට වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කළ යුතුය. |

**3.8 මානව සම්පත් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගොවිජන සේවා කාරක සභා 24 කට අදාළව මධ්‍යස්ථාන කළමනාකරණ සහකාර නිලධාරීන් 16 ක ගේ තනතුරුවල පුරප්පාඩු පැවතුණි. තවද කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර නිලධාරීන්ගේ අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව පිළිවෙලින් 504 ක් හා 341 ක් විය. ඒ අනුව නිලධාරීන් 163 කගේ පුරප්පාඩු පැවතුණි. | ගාල්ල දිස්ත්‍රික්කයට අනුමත මධ්‍යස්ථාන කළමනාකරණ නිලධාරි සංඛ්‍යාව 66ක් වන අතර දැනට සිටින නිලධාරි සංඛ්‍යාව11කි. 2015 න් පසු කළමනාකරණ නිලධාරි බඳවා ගැනීම් සිදුකර නොමැත. ගාල්ල දිස්ත්‍රික්කයට අනුමත කෘෂිකර්ම පර්යේෂන හා නිෂ්පාදන සහකාර නිලධාරි සංඛ්‍යාව 718ක් වන අතර දැනට සිටින නිලධාරි සංඛ්‍යාව 489කි. 2015 න් පසුව කෘෂිකර්ම පර්යේෂන හා නිෂ්පාදන සහකාර නිලධාරීන් බඳවා ගැනීම් සිදුකර නොමැත. | කාර්ය මණ්ඩල සමාලෝචනයක් සිදු කර අත්‍යවශ්‍ය කාර්ය මණ්ඩලය බඳවා ගැනීමට පියවර ගත යුතුය. |
| (ආ) | විධිමත් ස්ථාන මාරු ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක නොවීම නිසා මධ්‍යස්ථාන නිලධාරීන් වසර 09 කට වඩා වැඩි කාලයක සිට එකම මධ්‍යස්ථානයේ සේවය කරමින් සිටින බව නිරීක්ෂණය විය. | වසර 05 ක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධාරීන්ගේ තොරතුරු සෑම වසරකම අදාල චක්‍රලේඛ අනුව යාවත්කාලීන කරණු ලබන අතර වාර්ෂික ස්ථාන මාරු අපේක්ෂිත | වාර්ෂික ස්ථාන මාරු ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| | නිලධාරින්ගේ අයදුම්පත් අදාල නිර්දේශ සහිතව නියමිත දිනට අදාල නියෝග අනුව ක්‍රියාත්මක කරන බවද දන්වා සිටිමි. මධ්‍යස්ථාන වල සේවය කරනු ලබන නිලධාරීන්ගේ ස්ථාන මාරු දෙපාර්තමේන්තු චක්‍රලේඛ අනුව සිදු කරන බවද දන්වා සිටිමි. | |

**4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

**4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2023 ජුනි 22 දිනැති අංක PED 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 ඡේදය පරිදි කිසියම් වර්ෂයකට අදාළ මූල්‍ය ප්‍රකාශන අදාළ මුදල් වර්ෂය අවසාන වී දින 60 ක් තුළ විගණකාධිපති වෙත ඉදිරිපත් කළයුතු වුවත් ගොවිජන සේවා කාරක සභා 29 ක් විසින් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර තිබුණේ දින 11 සිට දින 133 ක කාල පරාසයක ප්‍රමාදයකින් පසුවය. | එකඟ වෙමි. ඉදිරියේදි පෙබරවාරි 28 දිනට පෙර ලබා දීමට එකඟ වෙමි. | රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ ප්‍රකාරව නියමිත දිනට මූල්‍ය ප්‍රකාශන විගණනයට ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතු අතර, අනුකූල නොවූ පාර්ශව වෙත පියවර ගත යුතුය. |